# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | **බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව** |
| **දිනය** | : | **2014-08-28** |
| **වේලාව** | : | **පෙ.ව. 10.00** |

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ර්. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 9. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

2012/2013 වර්ෂය සඳහා පවත්වන ලද ශ්‍රී ලංකා ජාතික ඵලදායිතා සම්මාන තරගයේ දෙවන ස්ථානය බලංගොඩ නගර සභාව විසින් දිනා ඇති බවත්, නගර සභා අනුව ගත්විට සමස්ත නගර සභඅතරින් ප්‍රථම ස්ථානය හිමි වී ඇත්තේ අප නගර සභාවට බවත්, එය අප ආයතනයට මෙන්ම නගරයටත් මහත් අභිමානයක් බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. ඒ සඳහා ඇප කැප වී ක්‍රියාකල කාර්යය මණ්ඩලය ඇතුළු සියළුම දෙනාට ස්තුතිය පිරිනැමූ ගරු සභාපතිතුමා සැප්තැම්බර් මස හතර වෙනි දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වනු ලබන සම්මාන හා තිලිණ ප්‍රදානෝත්සවය සඳහා සභාපතිතුමා සමග නිලධාරින් පස් දෙනෙකුගේ කණ්ඩායමකට ආරාධනා ලැබී ඇති බවත්, ඊට සහභාගි වීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කර ගන්නා ලෙසත් දැනුම් දෙන ලදී.

ඊට අමතරව 2014 වර්ෂයේ අතිගරු ජනාධිපතිතුමා වෙන්කල මුදල් ප්‍රතිපාදන තුළින් සියයට හතලිහක පමණ ප්‍රමාණයක වැඩ මේ වන විට අවසන් කර ඇති බවත්, ඉතිරි වැඩ කටයුතු ඉදිරි මාස දෙක,තුනක කාලය තුළ නිම කර නගර වැසියන්ට අවශ්‍ය වන්නා වූ පහසුකම් හා සේවාවන් සපයා දීම තුළින් තෘප්තිමත් හා යහපත් සේවාවක් ලබාදීමට අපේක්ෂා කරන බවත්, ගරු සභාපතිතුමා විසින් පවසන ලදී. එමෙන්ම කාර්යය සාධන හා ඵලදායිතා තරගයන් පැවැත්වීමෙන් සිදුවන්නේ අපව තව තවත් දිරිමත් කිරීමක් හා ඇගයීමක් බවත්, එම ඇගයීම තුළ අප සියළුදෙනාට ප්‍රීතියෙන් තම සේවාව සැපයීමට හැකිවන බවත්, ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඉදිරි මාසයේදි සභාව විසින් ජනතාවට සේවය කිරීම සඳහා ගන්නා තීන්දු තීරණ ගෙන ඒවා සඵලදායි ලෙස ක්‍රියාත්මක කර ගැනීමට අවශ්‍ය සහය සභාව වෙත ලබාදෙන මෙන් ගරු සභාපතිතුමන් විසින් ඉල්ලා සිටින ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය සභා වාර්තාවේ සඳහන් වී ඇති පරිදි ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදනයන්හි සඳහන් ''2013 අයවැය ඉදිරිපත් කිරීමේ දී රුපියල් කෝටි 300 ක පමණ සංවර්ධන කාර්යයන් නිමකරවා තිබූ බව ද " යන්න රුපියල් කෝටි 300 ක් නොව රුපියල් ලක්ෂ 335 ක් ලෙස නිවැරදි විය යුතු යැයි ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදි වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා විසින් පවසා සිටියේ විදුලි බල මණ්ඩලය ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීමේ දී ජනතාවගෙන් විශාල ශ්‍රම දායකත්වයක් හා ද්‍රව්‍යමය දායකත්වයක් ලැබුන හෙයින් රුපියල් ලක්ෂයක් 100,000 පමණ වැයවන කාණු පද්ධතියක් ඉතා අඩු මුදලකින් නිම කිරීමට හැකි වීම සම්බන්ධයෙන් සතුටට පත්වෙන බවය. එමෙන්ම බුලත්ගම, වලව්වත්ත මාර්ගය හා තානායම් වත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ කටයුතුවල දී ද මහජනතාවගෙන් ශ්‍රම දායකත්වයක් ලැබුණ බව සඳහන් කරන ලදී. එමෙන්ම තවත් මාර්ග කීපයක සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතින බවත්, කඩිනමින් ඒවායෙහි වැඩ නිම කිරිමට අවශ්‍ය කටයුතු කරගෙන යන බවත් ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

තව ද සභා කර්මාන්ත 2014 ව්‍යාපෘතියේ ලක්ෂ විසිපහෙන් ලක්ෂ දහනවයක වැඩ කටයුතු නිමාකර ඇති බවත්, මග නැගුමෙන් ලද ලක්ෂ පනහක මුදලින් සියයට අසූවක පමණ වැඩ කටයුතු නිමාකර ඇති බවත්, පළාත් සභාවෙන් ලද ලක්ෂ එකහමාරක පමණ මුදලින් බෝම්බුව ජයවර්ධන මහතාගේ නිවසට යන මාර්ගයේ කාණු පද්ධතියෙහි වැඩ ආරම්භ කර ඇති බවත්, ගරු පළාත් සභා මන්ත්‍රී

අකිල එල්ලාවල මැතිතුමා විසින් ලබාදුන් ලක්ෂ පහක මුදලින් , බැංකියවත්ත පියදාස මහතාගේ නිවසට යන මාර්ගය හා පැති බැම්ම සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති බවත්, ගමින් ගමට, දොරෙන් දොරට වැඩ සටහන යටතේ කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති 10ක් පමණ මුළුමනින්ම නිමා වී ඇති බවත්, ඉතිරි ව්‍යාපෘතිවලින් සියයට හතලිහක පමණ සංවර්ධන කටයුතු අවසන් බවත්, ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් පවසන ලදී.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 බලන්ගොඩ, රත්නපුර පාර අංක 56 1/ 1 දරණ ගොඩනැගිල්ල සඳහා වරිපනම් බදු නිදහස් කර ගැනීම - එන්. එස්. ලියනගේ

බලන්ගොඩ, රත්නපුර පාර අංක 56 1/ 1 දරණ ගොඩනැගිල්ල සඳහා වරිපනම් බදු නිදහස් කර ගැනීම සඳහා එන්. එස්. ලියනගේ යන අය යොමු කළ ඉල්ලීම අනුව වරිපනම් බදු මුදලින් 50% ක් පමණක් නිදහස් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:02 2015 වර්ෂය සඳහා වරිපනම් බදු ප්‍රතිශතය තීරණය කර ගැනීම.

බලන්ගොඩ නගර සීමාව තුළ පිහිටි සියළු දේපළ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර, 2012 වර්ෂයේ තක්සේරු ප්‍රතිශෝධනය අනුව සියළු දේපළ සඳහා 2015 වර්ෂයේ දී බදු මුදල් අයකිරීමටත් ,

255 වන අධිකාරිය වූ නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරිය වූ නගර සභා ආඥා පනතේ 238 වන වගන්තියේ (1) උප වගන්තියෙන් නගර සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියළුම දේපළවල 2012 තක්සේරු ප්‍රතිශෝධනය අනුව ලබා දී ඇති වාර්ෂික වටිනාකම 2015 වර්ෂයේ වාර්ෂික වටිනාකම වශයෙන් පිළිගැනීමටත්,

එකී නගර සභා ආඥා පනතේ 160 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන්,

(අ) නේවාසික ස්ථාන මත සියයට හතර (4%) ක වරිපනමක් ද, සහ

(ආ) වෙළෙඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයක පහ (5%)ක වරිපනමක් ද,

2015 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් , ඒ වරිපනම්, එකී නගර සභා ආඥා පනතේ 170 වන වගන්තිය සමග කියැවිය යුතු ඉහත කී නගර සභා ආඥා පනතේ 230 වන වගන්තියේ (2)වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවල දී අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:03 2015 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු , ව්‍යාපාරික බදු හා කර්මාන්ත මුදල් ප්‍රතිශතය තීරණය කර ගැනීම**

2015 වර්ෂයට බදු පැනවීම සඳහා සභා තීරණයක් ගෙන ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත්කල යුතුව ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලදී. ඒ අනුව කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාල අතුරු ව්‍යවස්ථා යටතේ,

2015 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම.

ලංකා නීති ප්‍රඥාප්තියේ 255 වන අධිකාරිය වු නගර සභා ආඥාපනතේ 164(1) වගන්තිය අනුව නගර සභාව විසින් සම්පාදනය කරන ලද ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ අංක 11263 හා 1958.02.21 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත අන්ත්‍රාදායක හා අප්‍රසන්න ව්‍යාපාර ලෙස බළන්ගොඩ නගර සභාව විසින් පිළිගෙන ඇති පහත සඳහන් කර්මාන්ත සඳහා බළන්ගොඩ නගර සභාව වීසින් 2015 වර්ෂය තුලදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 162 වන වගන්තිය සමග කියවිය යුතු 164 වන වගන්තියෙන් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උප ලේඛණයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උප ලේඛණයේ 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමට ගරු සභාපතිතුමා යෝජනා කල අතර, එම යෝජනාව එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

උපලේඛණය - අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

| 1 වන තීරුව | 11 වන තීරුව | | |
|---|---|---|---|
| අනු අංකය / කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්<br>750 නොඉක්මවන අවස්ථාවක | 750 ට වැඩි එහෙත් 1.500 නොඉක්මවන අවස්ථාවක | 1,500 ඉක්මවන අවස්ථාවක |
| 01. නවාතැන් පලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 02. තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03. හෝටලයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 04. බේකරියක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 05. බාබර් සාප්පුවක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 06. ගෝඝාතනාගාරයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 07. භෝජනාගාරයක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 .බත් කඩයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 09. ලොන්ඩරියක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. කිරිපට්ටියක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 11. මස් හෝ මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 12. වී මෝලක් පවත්වාගෙනයාම | 500'00 | 750'00 | 1000.00 |
| 13. සත්ව ආහාර අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. දිය ලුණු පැකට් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 15. පපඩම් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000'00 |
| 16. කම්හල් පවත්වා ගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| 17. ගරාජ පවත්වා ගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 18. වෑල්ඩින් වැඩපලවල් පවත්වා ගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 19. මුද්‍රණාල පවත්වා ගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 20. බෝතල් /පත්තර/ගෝනි විකිණීම | 500.00 | 750.00 | 1000.00 |

**2014 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම.**

255 වන නගර සභා ආඥාපනතේ 165ආ වන වගන්තියෙන් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී ආඥාපනතේ 165අ වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2015 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම , එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උප ලේඛනයේ 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එහි 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2015 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් , බද්දට යටත් සෑම තැනැත්තකුම එකී ව්‍යාපාර බද්ද 2015 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර බළන්ගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

උපලේඛනය

| | 1 වන තීරුව<br>බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ<br>ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | 11 වන තීරුව<br>ගෙවිය යුතු බද්ද<br>රු. ශත |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් 12,000 නොඉක්මවන විට | 90.00 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් 18,750 නොඉක්මවන විට | 180.00 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් 75,000 නොඉක්මවන විට | 360.00 |
| 5. | රු. 75,000 ඉක්මවන නමුත් 1,50,000 නොඉක්මවන විට | 1,200.00 |
| 6. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000.00 |

| | |
|---|---|
| 01. | දුරකථන සේවා |
| 02. | නියෝජිත තැපැල් කාර්යාල |
| 03. | පොදු සේවා ස්ථාන |
| 04. | කොන්ත්‍රාත්කරුවන් |
| 05. | රක්ෂන නියෝජිතයින් |
| 06. | මූල්‍ය ආයතන |
| 07. | පෞද්ගලික ආරෝග්‍යශාලා |
| 08. | බ්‍රෝකරවරුන්/ වෙන්දේසි කිරීම |
| 09. | ඇඟලුම් කර්මාන්තශාලා |
| 10. | කොමිස් නියෝජිතයින් |
| 11. | සිනමා ශාලා |
| 12. | උකස් බඩු ගන්නා ස්ථාන |
| 13. | ඉන්ධන පිරවුම්හල් |
| 14. | රටබීමඅලෙවිසැල් (මත්පැන්) |
| 15. | ලොතරැයි අලෙවිකිරීම |
| 16. | විවිධ සෙල් ස්ථාන |
| 17. | රන්භාන්ඩ උකස් සේවාව |
| 18. | යම් ලාභ උපයන ව්‍යාපාරයක් හෝසේවා සපයන ආයතනයක් |
| 19. | ඉඩකඩම් හා ගොඩනැගිලි අලෙවි කිරීම |
| 20. | සේවා සැපයෙන ස්ථාන |
| 21. | රථවාහන හා යන්ත්‍ර සූත්‍ර කුලියටදීම |
| 22. | වෛද්‍ය සේවවන් පවත්වා ගෙනයාම |
| 23. | රන් භාණ්ඩ නිපදවීම හා අලෙවිකිරීම |
| 24. | ගොඩනැගිලි උපකරණ හා ද්‍රව්‍ය අලෙවි කිරීම |

| | |
|---|---|
| 25. | රෙදිපිළි හා නිමි ඇඳුම් අලෙවි කිරීම |
| 26. | ආහාර ද්‍රව්‍ය තොග වශයෙන් අලෙවි කිරීම |
| 27. | ලී වෙළඳාම |
| 28. | යතුරු පැදි හා වාහන අමතර කොටස් අලෙවි කිරීම |
| 29. | රියදුරු පුහුණු ස්ථානයක් සඳහා |
| 30. | පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් සඳහා |
| 31. | රෙදිවෙළඳ සැලක් සඳහා |
| 32. | සිල්ලර බඩු වෙළඳ සැලක් සඳහා |
| 33. | කුළුබඩු මිළට ගැනීමේ හා අලෙවි කරණ ස්ථානයක් පවත්වාගෙනයාම |
| 34. | බිස්කට් තොග වෙළඳ ස්ථානයක් පවතාවා ගෙනයාම |
| 35. | ප්‍රචාරක දැන්වීම් අඳින ස්ථානයක් පවත්වාගෙනයාම |
| 36. | පෞද්ගලික ළදරු පාසලක්පවත්වා ගෙනයාම |
| 37. | මිශ්‍ර වෙළඳාමක් පවත්වා ගෙනයාම |
| 38. | යකඩ කම්හලක් පවත්වා ගෙනයාම |
| 39. | ලියවන පට්ටලයක් පවත්වා ගෙනයාම |
| 40 | සත්ත්ව ආහාර ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් සඳහා |
| 41. | රේස් ඔට්ටු එකතු කරන ස්ථානයක් පවත්වා ගෙනයාම |
| 42. | සිගරට් තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් සඳහා |
| 43. | බයිසිකල් අමතර කොටස් හෝ බයිසිකල් විකිණීමේ ස්ථානයක් සඳහා |
| 44. | පොත්පත් ලිපිද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා |
| 45. | ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා |
| 46. | රා තබෑරුමක් පවත්වා ගෙනයාම |
| 47. | සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙනයාම |
| 48. | උළු හෝ ගඩොල් ගබඩාකර තබා ගැනීම සඳහා |
| 49. | දර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා |
| 50. | දැව ගබඩාවක් පවත්වා ගෙනයාම සඳහා |
| 51. | මෝටර් රථ අමතර කොටස් අලෙවි කිරීම සඳහා |
| 52. | බෙලෙක් වැඩපලක් පවත්වා ගෙනයාම සඳහා |
| 53. | මෝටර් වාහන සඳහා බොඩි නිපදවන ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා |
| 54. | මොටර් රථ සර්විස් කරන ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා |
| 55. | ඉඩම් විකුණනහා රථ වාහන කුලියට දීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම |
| 56. | සේවා සපයන යම් ස්ථානයක් පවතක්වා ගෙනයාමසඳහා |
| 57. | දේශීය ඩිස්පෙන්සරියක් පවත්වා ගෙනයාම සඳහා |
| 58. | බටහිර ඩිස්පෙන්සරියක් පවත්වා ගෙනයාම සඳහා |
| 59. | උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක්සඳහා |
| 60. | සමුපකාර ප්‍රාදේශිකයක් පවත්වා ගෙනයාම සඳහා |
| 61. | පාවහන් වෙළඳසැලක් පවත්වා ගෙනයාම සඳහා |
| 62. | ගෘහ භාණ්ඩ අලෙවිසැලක් පවත්වා ගෙනයාම සඳහා |
| 63. | ඉංග්‍රිසි බෙහෙත් විකිණීම සඳහා |
| 64. | ආයුර්වේද ඖෂධ විකිණීම සඳහා |
| 65. | ඡායා පිටපත් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා |
| 66. | පරිඝණක අධ්‍යාපන ආයතනයක් පවත්වා ගෙනයාම සඳහා |
| 67. | ග්‍රොසරියක් පවත්වා ගෙනයාම සඳහා |
| 68. | නගර සභා කඩ කාමර /පොදු වෙළඳසැල වනපාර සඳහා |
| 69. | එක් ආයතනයක් තුල වෙළඳ කටයුතු කිහිපයක් පවත්වා ගෙනයාම සඳහා |
| 70. | වෙළඳ නියෝජිත සීථානයක් සඳහා |
| 71. | භාණ්ඩ නිෂ්පාදිත ආයතනයක සඳහා |
| 72. | ළදරු පාසැලක් පවත්වා ගෙනයාම |

## 2015 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම.

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 165අ වන වගන්තියෙන් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් , එම උප ලේඛනයේ 11 වන තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2015 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත් , එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2015 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර බළන්ගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර , එම යෝජනාව , ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

උපලේඛනය

| | 1 වන තීරුව | 11 වන තීරුව |
|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්<br>750 නොඉක්මවන අවස්ථාවක \| 750 ට වැඩි එහෙත් 1.500 නොඉක්මවන අවස්ථාවක \| 1,500 ඉක්මවන අවස්ථාවක |

| | | | |
|---|---|---|---|
| 01. කුෂන් වැඩ කිරිම | 500.00 | 750.00 | 1000.00 |
| 02. ගීත පටිගත කිරීම හෝ තැටිගත කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 03. ඇස් කණ්නාඩි විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 04. දැව ඉරුම් පට්ටලයක් (ලී මෝලක්) පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 05. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම | 500'00 | 750'00 | 1000.00 |
| 06. ස්වර්ණාභරණ නිපදවීම හා/හෝ විකිණීම | | | 1000.00 |
| 07. බයිසිකල් හා/හෝ බයිසිකල් අමතර කොටස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 08. පින්තූර රාමු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 09. ටයර් හෝ ටියුබ් විකිණීම හා/හෝ වොල්කනයිස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 10. මෝටර් බයිසිකල් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. මැටිභාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 12. උළු අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 13. සිමෙන්ති ගඩොල් නිපදවීම හා/හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 15. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 16. ලී බඩු අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 17. මිනීපෙට්ටි විකිණීම හා/හෝ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 18. බ්රේක් ලයිනර් විකිණීම හා/හෝ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 19. ජල පොම්ප අමතර කොටස් අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 20. ජංගම දුරකථන අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 21. ටයිල් අලෙවිකිරීම හා/හෝ නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| 22. වාහන අමතර කොටස් අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 23. ඇළුමිණියම් භාණ්ඩ අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 24. වීදුරු භාණ්ඩ අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 25. පිත්තල භාණ්ඩ අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 26. ඇඹරුම්හලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 28. ලී වෙළඳසැලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 29. ලියවන පට්ටලයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 30. ගමන් මලු හෝ පාවහන් සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 31. කොන්ක්‍රීට් නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 32. පාවහන් අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |

**06:04 පොදු වෙළඳසැල පිටුපස අංක 35/23 කඩකාමරය කඩකුලී ලේඛනයෙන් ඉවත් කිරීම.**

පොදු වෙළඳසැල පිටුපස අංක 35/23 කඩකාමරය කඩකුලී ලේඛනයෙන් ඉවත් කිරීමට සහා අවසරයක් ගත යුතුබව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. ඒ අනුව එම කඩ කාමරය කඩකුලී ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මේ සඳහා වෙනත් අදහස් ඉදිරිපත් නොවූ අතර එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 පළාත් පාලනය පිළිබද මූල්‍ය කළමණාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2014/ 2015**

2014/2015 වර්ෂය සඳහා පළාත් පාලනය පිළිබඳ මූල්‍ය කළමනාකරණ පාඨමාලාව හැදෑරීම සඳහා සභාවෙන් මුදල් ගෙවීමට අනුමැතිය ඉල්ලමින් නගර සභාවේ සේවයේ නියුතු නිලධාරී මහත්මීන් දෙදෙනෙක් විසින් කර තිබූ ඉල්ලීම අනුව ඊට එක් අයෙකු සඳහා වැයවෙන රුපියල් 40,000 ක මුදලින් අඩක් සභාව මගින් ගෙවීමට හැකි බවත්, එමෙන්ම වසර 5ක් යන තුරු ස්ථාන මාරුවීම් නොකරන බවට පළාත් සභාව වෙතින් ලබාගත යුතු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 නිකිණි උදානය, 2014 වෙළෙඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය, විනෝද බදු මුදල් නිදහස් කර ගැනීම ශක්ති යොවුන් පදනම**

ශක්ති යොවුන් පදනම විසින් සංවිධානය කරනු ලබන වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය 2014 අගෝස්තු මස 27 සිට 31 දින දක්වා බළන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ දී පැවැත්වෙන අතර, ඔවුන්ගේ ඉල්ලීමට අනුව මේ සඳහා අය කරන 25%ක විනෝද බදු මුදල ලෙස ලක්ෂ 5ක් ලබාගැනීමටත්, තැන්පත් මුදල් ලෙස රු. 50,000 ක මුදලක් හා ක්‍රීඩා පිටිය සඳහා රු.20,000ක මුදලක් ලබාගැනීමටත්, ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමන්ලා විසින් විවිධ අදහස් දැක් වූ අතර, එම අදහස් සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමා පවසා සිටියේ ඉතිහාසයේ කිසිදිනෙක ක්‍රීඩා පිටිය ලබාදීමෙන් රු.500,000 මුදලක් ලබාගෙන නොමැති හෙයින් මෙය සුවිශේෂී අවස්ථාවක් බවත් එම යෝජනාව තමා ස්ථිර කරන බවත්ය.

ඉන් අනතුරුව මෙම කරුණ මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 නව බස් නැවතුම්පොල කඩ කාමරයක් ලබා ගැනීම - ජී.ඩබ්. නෙල්සන් සිල්වා**

දැනට බස්නැවතුම්පොළ ඉහළ මාලයේ හිස්ව පවතින ඩී 16 කඩ කාමරය තමා වෙත ලබා දෙන මෙන් බලංගොඩ, බලගහමුල, කල්තොට පාර, අංක 8 පදිංචි ජී. ඩබ්. නෙල්සන් සිල්වා යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහ රු.6000 බැගින් මාස 9ක තැන්පත් සි මුදල් අයකර එය ලබා දීමට කටයුතු කරනලෙස ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 ඉදිකරගෙන යන ගොඩනැගිල්ලක් සඳහා විරෝධතාවය පළ කිරීම.**
**(රිෂානා සර්විස් මාර්ගයේ ප්‍රදේශවාසීන්.)**

රිෂානා සර්විස් මාර්ගයේ නිවසක පවත්වා ගෙන යන ගෙස්ට් හවුස් එකක් සම්බන්ධව විරෝධය පළකරමින් ප්‍රදේශවාසීන් සභාව වෙත එවන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර, අදාල ආයතනය , නගර සභාවේ සම්මත නීති රීතිවලට අනුකූලව පවත්වාගෙන යන්නේ නම් පමණක් ඒ සඳහා අවසර දීමට සිදු වන බව ප්‍රකාශ කරන ලදී. කෙසේ නමුත් මේ සම්බන්ධව ගැසට් පත්‍රය මගින් විරෝධතා ගොනු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත් මේ සඳහා පත්කරනු ලබන කමිටුවේ තීරණය අවසන් තීරණය ලෙස පිළිගන්නා ලෙසටත් යෝජනා කරන ලදී.

මෙම ඉදිකිරීම සම්බන්ධව විරෝධතාවය පළකරමින් ගම්වාසීන් වෙනුවෙන් අදහස් දැක්වූ ගරු උපසභාපතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

## 07. රු. 10,000.00 ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

රු. 10,000.00 ට වැඩි ගෙවීම් සියල්ල මුදල් කමිටුවට ඉදිරිපත් කර ඇති බව පවසමින් ගරු සභාපතිතුමන් විසින් එය මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

මෙවර සභාවාරය සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කර නොතිබුණි.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

මෙවර සභාවාරය සඳහා ලංසු මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

මෙවර මහා සභාවට යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි.

## 11. යෝජනා

### 11ඃ01 නගර සභා ගරු මන්ත්‍රි ධර්මසේන සමරසිංහ මැතිතුමා

11ඃ01ඃ01 පොදු වෙළෙඳසැල සඳහා මුරකරුවෙක් පත් කිරීම.

11ඃ01ඃ02 පොදු වෙළෙඳසැල පිටුපස ඇති වැසිකිළි පද්ධතිය ඉවත් කර නව වැසිකිළි පද්ධතියක් සකස් කිරීම

11ඃ01ඃ03 බෝම්බුව පන්සල ඉදිරිපිට කාණු පද්ධතිය සමඟ පැති බැම්මක් ඉදිකිරීම හා සදුන්ගම ඉහළ කොටසේ මාර්ගය අබලන්ව ඇති කොටස් අළුත්වැඩියා කිරීම.

ඉහත යෝජනා ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මෙම සංවර්ධන කටයුතු ඉදිරියේ දි ක්‍රියාත්මක කිරීමට අදහස් කරන බව ද මෙවැනි සංවර්ධන කටයුතු කර්මාන්ත හා සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරන ලෙස ද දන්වන ලදි. මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 11ඃ02 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා

11ඃ02ඃ01 ශ්‍රී ලංකාවේ ළාබාලතම ආසන සංවිධායක ලෙස පිදුම් ලැබූ අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමාට සුභ පැතීම.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රි චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වමින් අඩු වයසින් එක්සත් ජාතික පක්ෂයෙන් බිහි වූ ළාබාලතම ආසන සංවිධායකවරයෙක් වශයෙන් දේශපාලන ජීවිතයේ දීර්ඝ ගමනක් යාමට අවශ්‍ය ශක්තිය ලැබේවා යි මහ සභාවේ ගරු සභාපතිතුමා ,ගරු උප සභාපති තුමා ඇතුළු පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රීවරුන් විසින් ගරු නාගරික මන්ත්‍රි අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා වෙත සුභ පැතුම් පිරිනමන ලදී.

එහිදී ඒ සඳහා ස්තුතිය පිරිනමමින් අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා පවසා සිටියේ දිස්ත්‍රික්කයේ අනෙකුත් ආසන සංවිධායකවරුන් සමඟ එකමුතුව සාමකාමී දේශපාලන ගමනක් යාමට තමන් අපේක්ෂා කරන බවයි.

**11:02:02 කිරිඳිගල මැද පාරේ අළුතෙන් ඉදිකල කොන්ක්‍රීට් මාර්ගය සඳහා පැති කාණුවක් යෙදීම**

**11:02:03 උඩ ඇල්ලෙපොල පොදු නාන ටැංකිය පිළිසකර කිරීම.**

ඉහත යෝජනා ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, කිරිඳිගල මැද පාරේ කොන්ක්‍රීට් මාර්ගය සඳහා පැති කාණුව යෙදීම පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කරන ලෙස ගරු නාගරික මන්ත්‍රි ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමාට පවසන ලදී. එමෙන්ම මුදල් තත්ත්වය සලකා බලා මෙම සංවර්ධන කටයුතු කඩිනමින් ඉටු කිරීම සඳහා යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 මුදල් කාරක සභා වාර්තාව

2014.08.25 වන දින පැවති මුදල් කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:02 කර්මාන්ත හා සංවර්ධන කාරක සභා වාර්තාව

2014.08.25 වන දින පැවති කර්මාන්ත හා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:03 සෞඛ්‍ය, ඝන අපද්‍රව්‍ය හා උපදේශන කාරක සභා වාර්තාව

2014.08.15 වන දින පැවති සෞඛ්‍ය, ඝන අපද්‍රව්‍ය හා උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:04 තානායම් කමිටු වාර්තාව

2014.08.25 වන දින පැවති තානායම් කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඒ සඳහා ඉදිරිපත් වූ අතර එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:06 ආපදා කළමණාකරන කමිටු වාර්තාව**

2014.08.15 වන දින පැවති ආපදා කළමණාකරන කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඒ සඳහා ඉදිරිපත් වූ අතර එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

**13:01 2014 ජූලි මාසය සඳහා වන ලැබීම් හා ගෙවීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 6,337,381.26 |
| වෙනත් ලැබීම් | 762,538.30 |
| මුළු ලැබීම් | 7,099,919.56 |
| පුනරාවර්තන වියදම් | 7,300,358.82 |
| වෙනත් වියදම් | 2,008,039.65 |
| මුළු වියදම් | 9,308,398.47 |

ඉහත වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, අදහස් කිසිවක් ඒ සඳහා ඉදිරිපත් නොවුණි.

**13:02 2014.07.01 සිට 2014.07.31 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2014.07.01 සිට 2014.07.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 626,918.20 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

# 14. වෙනත් කරුණු

## 14:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා

වැවේවත්ත ළදරු පාසල සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු උප සභාපතිතුමා පැවසුයේ එහි පවතින ගුරුවරියගේ ගැටළුවට කඩිනමින් විසඳුමක් අවශ්‍ය බවත්, එම ළදරු පාසල බිඳ වැටීමට ඉඩ දිය නොහැකි බවත් ය. එම නිසා මෙහි පවතින සත්‍ය තත්වය හඳුනා ගෙන ජාතින් අතර සහයෝගිතාවය වර්ධනය උදෙසා උපකාරී වන හෙයින් දමිළ හෝ මුස්ලිම් ගුරුවරියකගේ සේවය හෝ ලබාගෙන මෙම ළදරුපාසලේ ප්‍රතිලාභ අඛන්ඩව ජනතාව වෙත ලබාදීමට අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම මේ වන විට බලංගොඩ මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකයේ වැඩ කටයුතු කරගෙන යාමට නිර්වින්දන වෛද්‍යවරයෙක් නොමැති හෙයින්, එහි සියළු කටයුතු අකර්මන්‍ය වී ඇති බවත්, එහි පවතින කෝටි ගණනක් වටිනා වෛද්‍ය උපකරණ නිකරුනේ විනාශ වෙමින් පවතින බවත්, එය රැකගැනීමේ අවශ්‍යතාවය වෙනුවෙන් අවධානය යොමුකරන ලෙසත් ගරු සභාව හා මාධ්‍යවේදීන් දැනුවත් කරන ලදී.

## 14:02 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා

ගරු උප සභාපතිතුමන් ප්‍රකාශ කළ ආකාරයට බලංගොඩ මූලික රෝහල පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා ප්‍රකාශ කර සිටියේ දිවංගත මොහාන් සාලිය එල්ලාවල මැතිතුමා බලංගොඩ මූලික රෝහල දියුණු තත්වයට ගෙන ඒම සඳහා මහත් කැපවීමකින් ක්‍රියාකල බව ගෞරවයෙන් මතක් කරදෙන බවත්, මේ වන විට අකර්මන්‍ය වී පවතින දැඩි සත්කාර ඒකකය හා එමගින් සිදුවන වෛද්‍ය උපකරණ විනාශය පිළිබඳ වාර්තාවක් පළාත් සභාවේ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට හා ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා වෙත යවන ලෙසත් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම බලංගොඩ නගරයට විශාල අඩුපාඩුවක්ව පවතින විදුලි ප්‍රාදේශිය කාර්යාලයක අවශ්‍යතාවය පිළිබඳ අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා බලංගොඩ හා අවට ප්‍රාදේශයන්හි විශාල පාරිභෝගික ජනතාවක් සිටින බවත්, විදුලි විසන්ධි කිරීම්, නැවත සම්බන්ධතාවය ලබාගැනීම හා බිල්පත් ගෙවීම් කටයුතුවලට පහසුවීම පිණිස විදුලි ප්‍රාදේශිය කාර්යාලයක් බලංගොඩ නගරයේ ස්ථාපිත කර දෙන ලෙස ඉල්ලමින් ලිපියක් ගරු විදුලිබල අමාත්‍ය පවිත්‍රා දේවි වන්නි ආරච්චි මැතිතුමියටත් , ගරු විදුලිබල නියෝජ්‍ය අමාත්‍ය ප්‍රේමලාල් ජයසේකර මැතිතුමා වෙතත් යවන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

## 14:03 නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා

කිරිඳිගල අනඳමෙත්ගම ප්‍රජා ශාලාවට අයත්ව තිබූ මහෝගනී ගස් දෙකක් නගර සභාවේ අනුමැතිය අනුව කපා ඉවත්කර, ශෛලතලාරාම විහාරයට හා බෝම්බුව විහාරයට පූජාකර ඇති බවත්, එසේ පූජා කිරීම සම්බන්ධව කිසිදු ගැටළුවක් නොමැති නමුදු එසේ කිරීමට ඇති පදනම පිළිබඳව ගම්වාසීන් විසින් ප්‍රශ්න කරන බවත්, ප්‍රජා ශාලාවේ විදුලිය හා ජල බිල්පත් ගෙවීම් සිදුකරන්නේ ද සමිතිය මගින් යැයි ඔවුන් චෝදනා කරමින් පවසන බවත් ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව කරුණු ඇතොත් ඒවා ලිඛිතව ඔවුන් වෙත ඉදිරිපත් කරන ලෙසද ගරු මන්ත්‍රිතුමා විසින් වැඩිදුරටත් ඉල්ලා සිටින ලදී.

## 14:04 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා

අනඳමෙත්ගම මාර්ගයේ කාණු ගොඩවීම සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන මෙන් ද, කුමාරගම සොහොන් පිට්ටනිය සම්බන්ධව පරීක්ෂා කර බලා කටයුතු කරන මෙන් ද පෙර සභා වාරවල දී ද පැවසූ පරිදි රාජා ඩිස්පෙන්සරිය අසල බෝක්කුව සම්බන්ධව එහි තත්වය සලකා බලා සුදුසු පිළියමක් කඩිනමින් සිදුකර දෙන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම ගරු මන්ත්‍රී ධර්මසේන මැතිතුමා පසුගිය සභා වාරයේ සීඝ්‍ර භෞතික සංවර්ධනයක් රට තුළ සිදුවෙමින් පවතින බව පැවසූ නමුත් අධ්‍යාත්මික සංවර්ධනයෙන් රට පිරිහෙමින් පවතින බවත්, ඒ සඳහා මිනිසුන්ගේ බුද්ධි වර්ධනය දියුණු කිරීම සඳහා ක්‍රියාකල යුතු බවත් ගරු සභාවට පෙන්වා දෙන ලදී.

පලස්තීනයට සහනාධාර වශයෙන් රජය විසින් ලබාදුන් ඇමෙරිකන් ඩොලර් මිලියන 10 පිළිබඳව හා ලෝක වෙළෙඳ පොලේ තෙල් මිල පහල අගයක පවතින අවස්ථාවක තෙල් සංස්ථාව ඇමෙරිකන් ඩොලර් අටසිය හැත්තෑපන් ලක්ෂයක් පාඩුවීම පිළිබඳ අදහස් දක්වමින් නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා එය අපේ නගරයට සෘජුවම බල නොපෑ නමුත් වක්‍රකාරයෙන් බලපෑමට ලක්වන බවත් එහි ප්‍රතිවිපාක සියල්ලන්ටම අනාගතයේ දී විඳීමට සිදුවන බවත් පවසන ලදී.

එමෙන්ම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රි සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් පළාත් පාලන ආයතනවල මන්ත්‍රිවරුන්ගේ දීමනාව වැඩි කිරීම සම්බන්ධව ගෙන ආ යෝජනාව අතිගරු ජනාධිපතිතුමා විසින් ක්‍රියාත්මක කිරීමට ගනු ලැබූ තීරණය වෙනුවෙන් එම දෙපළට ස්තුතිවන්ත වන බව පැවසූ ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා , බොහෝ මන්ත්‍රීවරුන් තම දීමනාව පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබානොගන්නා බවත්, එහි ප්‍රතිලාභ මහජනතාව වෙත ලබා දෙන බවත්, එම නිසා මෙය වටිනා තීරණයක් බව ගරු සභාවට පෙන්වා දෙන ලදී.

**14:05 නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් පවසන ලද අනඳමෙත්ගම මාර්ගයේ කාණු ගොඩවීම සම්බන්ධව ගරු මන්ත්‍රීතුමන් විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ අළුතින් ලබා දුන් ඉඩම්වල පස් සෝදාගෙන විත් කාණු ගොඩ වෙන බවත්, JCB යන්ත්‍රය යොදා ගනිමින් විටින් විට ශුද්ධ පවිත්‍ර කලත් තත්ත්වය සම්පූර්ණයෙන් මැඩ පැවැත්වීමට අපොහොසත් නමුත් කලහැකි උපරිමයෙන් ක්‍රියා කරන බවත් ය.

එමෙන්ම රට තුළ සිදු වී ඇති විශාල භෞතික සංවර්ධනය හේතුවෙන් විදුලිය, දුරකථන,මං මාවත් සංවර්ධනය වී ඇති බවත්, චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් පැවසූ පරිදි සමාජීය, ආගමික පිරිහීම ප්‍රතික්ෂේප කරන බවත්, පාසල්, විශ්ව විද්‍යාල, පුහුණු සංවර්ධන ආයතන විශාල වශයෙන් දියුණු වී ඇති බවත්, දශක 30ක් තිස්සේ පැවති යුද්ධය නිසා වූ ජීවිත හානිය නිමා වී ඇති බවත්, අපරාධකරුවන් ඉක්මනින් නීතියට හසුකර ගන්නා බවත්, තරාතිරම නොබලා ඔවුන්ට දඬුවම් කරන බවත් ,ජනමාධ්‍ය නිදහස රට තුළ උපරිමයෙන් ක්‍රියාත්මක වන බවටත් අදහස් ප්‍රකාශ කරන ලදී.

වැඩි දුරටත් අදහස් දක්වමින් ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ප්‍රචණ්ඩත්වයෙන් තොර නිදහස් හා සාධාරණ මැතිවරණයක් රට තුළ ක්‍රියාත්මක වෙන බවත් ,මැතිවරණ ජයග්‍රහණය නිසැක බවටත් ගරු සභාව වෙත අදහස් ප්‍රකාශ කරන ලදී.

## 15. අවසානය

**ගරු සභාපති එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා ඉදිරිපත් කල ප්‍රශ්න සඳහා පිළිතුරු දෙමින් තෙල් මිල අඩුකිරීම සභාවක් ලෙස අපට කල නොහැකි කාර්යයක් බවත්, බොහෝ රටවල පවතින්නේ එක හා සමාන තෙල් මිලක් බවත්, රට තුළ අපරාධ රැල්ල වැඩි වීමක් දක්නට තිබුනත් ක්ෂණිකව ඒ සියල්ල සොයා බලා නීතිය ක්‍රියාත්මක කරන බවත් සභාපතිතුමන් විසින් පවසන ලදි.

එසේම ජාත්‍යන්තර වශයෙන් ගත් කළ ශ්‍රී ලංකාවේ නගර අතරින් බලංගොඩ නගරයට ප්‍රමුඛස්ථානයක් හිමිවන බවත් එය අවිවාදයෙන් පිළිගත යුත්තක් බවත්, මෙවර ජාතික ඵලදායිතා තරගයේ 02වන ස්ථානයට පත්වීම බලංගොඩ නගරයට මහත් අභිමානයක් බවත්, රටේ නායකයා ලෙස රටවැසියන්ට නිදහසේ ජීවත්වීමේ අයිතිය සුරකිමින් යුද්ධය නිමා කළ අතිගරු ජනාධිපතිතුමාට රට පිළිබඳව පැහැදිලි ඉලක්කයක් තිබෙන බවත්, රටේ ආර්ථික සුරක්ෂිතතාව පිළිබඳව එතුමා පැහැදිලි අවබෝධයකින් පසුවන බවත්, එනිසාම අප රටට ජාත්‍යන්තරව සහය පළකරමින් උපකාර කල පලස්තීනයට අසීරු අවස්ථාවක දී කෝටි 110 ක් පරිත්‍යාග කිරීම සම්බන්ධයෙන් දියුණු වෙන රටක් ලෙස අප සියළු දෙනා සතුටු විය යුතු බවත්, සභාවට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

එසේම රට තුළ අධ්‍යාත්මික ගුණ වගාව දියුණු කර ඇති බව පැවසූ ගරු සභාපතිතුමා සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකටම ස්වාමීන් වහන්සේ නමක් පත්කර ඇති බවත්, සෑම පොහොය දිනකම අරලිය ගහ මන්දිරයේ ධර්ම දේශනාවක් පවත්වමින් අතිගරු ජනාධිපතිතුමා රටට ආදර්ශයක් සපයන බවටත් අදහස් දක්වන ලදී.

එමෙන්ම නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා ඉදිරිපත්කල අනඳමෙත්ගම ප්‍රජාශාලාවේ මහෝගනී ගස් පිළිබඳ ගැටළුවට පිළිතුරු දෙමින් ගරු සභාපතිතුමා, එම ගස් ඉවත්කර දෙන මෙන් ඉල්ලා එහි සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන අයගේ අත්සනින් යුතව ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ලිපිය, නගර සභාව විසින් සමිතියට විදුලිය ලබාදුන් ලිපිය හා විදුලි බිල ගෙවීමට නොහැකි බව පවසා එය ගෙවා දෙන මෙන් කරන ලද ඉල්ලීම් ලිපිය ආදි ලිපි ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

අවසාන වශයෙන් අදහස් දක්වමින් ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන රටක් ලෙස මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා සහයෝගයෙන් කටයුතු කිරීමට කැපවිය යුතු බව දන්වමින් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ කටයුතු ප. ව. 1.30 ට අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.